**ශීර්ෂය 20 - මැතිවරණ කොමිෂන් සභාව**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මැතිවරණ කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.3 (අ) ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 මූල්‍ය ප්‍රකාශන තුළ 1003 හා 1101 වැය විෂයයන්හි ශේෂ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ නිවැරදි ලෙස සසඳා නොතිබුණි. | ගිණුම් පියවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ප්‍රථම කොමිෂන් සභාවේ පොත්වල පෙන්නුම් කෙරෙන සියලු ගිණුම් ශේෂ 2019 අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයේ ගිණුම් තොරතුරු සමඟ සසඳා විෂමතාවයන් නොමැති බවට තහවුරු කරගත යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි ආකෘතිය අනුව පිළියෙල කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඒසීඒ - සී ආකෘතිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**--------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රු. 95,536,927 ක් වූ වෙනත් ලැබීම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.27,164,554 ක් ලෙස රු. 68,372,373 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සහතික කරනු ලැබූ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයේ තොරතුරු අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම තුල දිස්ත්‍රික් කාර්යාල විසින් අපහරණය කරන ලද භාණ්ඩවල පිරිවැය ඇතුළත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුල අපහරණය කරනු ලබන සියලු භාණ්ඩවල පිරිවැය අවසන් ගිණුම් තුල ඇතුළත් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වාහනවල වටිනාකම හා ආයතනය සතු වාහන පිළිබඳ ශේෂ හා ස්ථාවර වත්කම් ලේඛනයේ එදිනට වූ ශේෂ අතර එකිනෙකට පරස්පර භාවයක් පැවතුණි. | වාහනවල නිවැරදි අගයන් සටහන් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල 20-1-1-2105 වැය විෂයය යටතේ ඉඩම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරන ලද රු. 985,613 ක වියදම වර්ෂය තුල ප්‍රාග්ධනිත කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි අන්තර්ගත කර නොතිබුණි. | 2105 වැය විෂයය යටතේ දරන ලද වියදම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු අවසන් නොකළ යාපනය දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් වැය කරන ලද රු. 33,208,354 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ නොනිමි වැඩ (61131), කාර්යාලීය ගොඩනැගිලි (6113109) යටතේ ප්‍රාග්ධනිත කළ යුතු වුවත් එය ස්ථාවර වත්කම්,ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ නොනිමි වැඩ 61131 යටතේ සඳහන් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 1647 | කොමිෂන් සභාව සතු වාහන හා උපකරණ පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | වාර්ෂිකව සමීක්ෂණයක් පැවැත් විය යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි.ඉදිරි වර්ෂයේ සිට සිදු කිරීමට නියමිතය. |
| (ii) මුදල් රෙගුලාසි 139(8) | මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ වැය කරන ලද මුදල වන රු.3,872,689 දෙපාර්තමේන්තු වැය ලෙජරයේ සඳහන් කර නොතිබුණි. | දරන ලද වියදම් නියමිත ලේඛනවල සටහන් කර වියිමත් පරිදි ගිණුම්ගත කළ යුතුවේ.2018 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව වියදම සටහන්ව ඇති අවස්ථාවක වැය ලෙජරයේද සටහන් කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී ප්‍රතිපාදන ලබා ගැනීමෙන් පසු 2019 වර්ෂයේ දී ගෙවීම් සිදු කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) **2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඒසීඒ - සී ආදර්ශ ආකෘතිය** | | | |
| **3.1ඡේදය** | 2019 මූල්‍ය ප්‍රකාශන තුල අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස අන්තර්ගත කර නොතිබුණි. | අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ඇ) **අභ්‍යන්තර චක්‍රලේඛ**<br>**-----------------------**<br>**(i) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක PRE/2019/06 දරන ලිපියේ** | | | |
| **2.9.2 ඡේදය** | මඩකලපු දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවට අදාළ පැමිණීමේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2.9.2 ඡේදය ප්‍රකාරව 2019-ජනාධිපතිවරණයට අදාලව පිහිටුවන ලද කමිටුවල කාර්යමණ්ඩලයේ පැමිණීමේ ලේඛන ඡන්ද විමසීමෙන් පසු සහකාර දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් වෙත ලබා දිය යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී නිවැරදි කිරීමට නියමිතය. |
| **2.7.1 ඡේදය** | මඩකලපු දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2.7.1 ඡේදය ප්‍රකාරව 2019-ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාලව සිදු කළ යුතු සියළු ප්‍රසම්පාදනයන්ට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි.ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී නිවැරදි කිරීමට නියමිතය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **වියදම් කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ 20-1-1-2509 වැය විෂයය යටතේ මැතිවරණ කළමනාකරණ වැඩසටහන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් වෙන්කර තිබුණු රු.5,050,000ක් වූ මුළු මුදලම ඉතිරිව තිබුණු අතර කාර්ය මණ්ඩල පුහුණු කිරීම් වැය විෂයයේද රු. 2,264,212 ක් ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර විධිමත් පුහුණු සැලැස්මක් තිබිය යුතු වේ. | මෙවැනි ව්‍යාපෘතියක් මැතිවරණ කොමිෂන් සභාව දැනුවත්ව ක්‍රියාත්මක නොවූ හෙයින් වියදම් අවශ්‍යතාවක් ඇති නොවිණි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් රු.10,955,000ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමකින් සිදු කිරීමට නියමිතව තිබුණු කාර්යයන් 15ක් සම්පූර්ණයෙන්ම සිදු කර නොතිබුණි. | සැළසුම් කළ පරිදි කාර්යයන් ඉටු කළ යුතු වේ. | මෙම කාර්යයන් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් වූ බැවින් ක්‍රියාකාරි සැලැස්මෙහිද ඇතුළත් කරන ලදී.පසුව ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රමුඛතා අනුව සංශෝධනය කරන ලදී. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීමේ කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කර එම වසරේදීම නිම කිරීමට සැලසුම් කර තිබුණ ද එම කාර්යය 2020 වර්ෂයේදීද නිම කර නොතිබුණි. | සැලැසුම් කළ පරිදි කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ දී ඇති වූ වර්ෂාව හේතුවෙන් දින 60ක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලදී.ගොඩනැගිල්ල වටා තාප්පයක් ඉදි කිරීම හේතුවෙන් පදිංචියට යැමට ප්‍රමාද විය. |
| (ආ) මැතිවරණ පැමිණිලි විමර්ශනය කිරීමේ පරිගණක පද්ධතිය සකස් කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට රු.1,952,500ක් 2017 වර්ෂයේ දී ගෙවා තිබුණු නමුත් එහි කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. | කාර්යය හැකි ඉක්මණින් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ආයතනය රාජ්‍ය ආයතනයක් වන බැවින් අදාළ පද්ධතියේ සම්පූර්ණ වැඩ නිම කිරීමට ආසන්නව තිබියදී අදාළ මුළු මුදලම ගෙවන ලදී.අදාළ පද්ධතියේ දෝෂ නිරාකරණය කර දෙන මෙන් 2019.12.30 දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මැතිවරණ පැමිණිලි විමර්ශනය කිරීමේ පරිගණක පද්ධතිය සකස් කිරීමේ දී එහි වූ mobile app නිර්මාණය කිරීමේ කාර්යය සඳහා රු.325,000ක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ගෙවා තිබුණ ද එකී කාර්යය නිම කර නොතිබුණි. | අදාල කාර්යයන් හැකි ඉක්මණින් අවසන් කරවා ගත යුතු වේ. | ගෙවන ලද මුදල් ආපසු කොමිෂන් සභාවට ලබා දීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් පද්ධතිය යාවත්කාලීන කර දිය හැකි බව දන්වා ඇත.<br>මෙම පහසුකම අනවශ්‍ය බව තීරණය කරන ලදී. |

**3.4 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාල මූලික අවබෝධතා ගිවිසුම අනුව වැඩ ආරම්භ කළ යුතු දින පසු වී මාස 06 කට පසුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර අත්තිකාරම් මුදල ලෙස රු.මිලියන.12.42 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට මාස 3 ½ කට පෙර ගෙවා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වී ඇත. |

**3.5 වෙනත් නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් පරිබාහිරව රු.2,285,000 ක වියදමින් සිදු කරන ලද කාර්යයන් 06ක් සඳහා වගකිව යුතු නිලධාරියෙකු ආයතනය විසින් නම් කර නොතිබුණි. | සැලසුම් කරන ලද හා ඉටු කරන සෑම කාර්යයන් සඳහාම අධීක්ෂණය සඳහා වගකිව යුතු නිලධාරියෙකු පත් කළ යුතුවේ. | අතපසු වීමකින් නිලධාරියා නම් කර නැත. |

**3.6 ප්‍රසම්පාදනයන්**

**පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රු.1,619,085 ක් වටිනා ඉබි යතුරු මිල දී ගැනීමට අදාළව විධිමත් පරිදි ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර ලංසු විවෘත කිරීමේ කමිටුවේ එක් සමාජිකයෙකු පමණක් ලේඛනවල අත්සන් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තාගත කළ යුතු අතර එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලු සාමාජිකයින් විසින් අත්සන් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි.කෙටි කලකදී කාර්යයන් සිදු කිරීම හේතුවෙන් මෙලෙස සිදු වී ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොමිෂන් සභා පරිශ්‍රයේ නව ගරාජයක් ඉදි කිරීමේ කාර්යයට අදාලව සිදු කරන ලද ප්‍රසම්පාදන කාර්යයේදී ඉදිරිපත් කර තිබුණු ප්‍රතිග්‍රහන ලිපිය විධිමත් පරිදි සකස් කර නොතිබුණු අතර අවස්ථා 05 කදී සකස් කර තිබුණු කොන්ත්‍රාත් ගිවිසුම් විධිමත් පරිදි සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1. ප්‍රකාරව ශ්‍රී ලංකා රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ඇ) | මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදි කිරීම සඳහා සකස් කරන ලද පිරිවැය ඇස්තමේන්තුව තුල පරිපාලන පිරිවැය සෘජු කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 2 ක් විය. | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.3.1 සහ 4.3.2 ප්‍රකාරව පරිපාලන පිරිවැය මුළු ඉදිකිරීමේ පිරිවැයෙන් සියයට 1 ට අඩු විය යුතුවේ. | 2019 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේ ලිපිය අමුණා ඇත. |
| (ඈ) | මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස ඉදිකිරීමේදී රු.763,807ක අමතර කාර්යයන් ආයතන ප්‍රධානියාගේ පූර්ව අනුමැතියකින් තොරව සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව විචලනයන්ගේ සාමාන්‍ය වටිනාකම (ප්‍රමාණයේ වෙනස් වීම් සහ අමතර වැඩ නියෝග කිරීම හේතුවෙන්) හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන තුල පවතී නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා / ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මෙම විචලන නියෝග අනුමත කළ හැකිය. | අමතර කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතියක් ඉල්ලා ඇති අතර අතපසු වීමකින් එම ලිපිය කාර්යාල ගොනුවේ ගොනු ගත කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රමාදයන් සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව කොන්දේසි කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි.ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම හා කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය අනුව එම කටයුතු නිම කිරීමේ දිනය අතර පරස්පරතාවයක් හා ප්‍රායෝගික බව අතර ගැටලුවක් පැවතුණි. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත් පිරිනැමීමේ කටයුතු සිදු කළ යුතු වේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ අඩුපාඩු පවතින අතර ඒවා නිවැරදි කර ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.7 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | **---------------------** | **------------** | **--------------------------** |
| (අ) | වාහන 04ක් භාවිතයෙන් තොරව ආයතන පරිශ්‍රයේ ගාල් කර තිබුණු අතර 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අනුව ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින මොනිටර්ස් 29ක් හා සර්වර්ස් 33ක් භාවිතයෙන් තොරව ගබඩා කර තිබුණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන , 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | මෙම වාහන කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ දී අපහරණයට හඳුනාගත් යතුරු පැදියක් සම්බන්ධයෙන් වූ අපහරණ කටයුතු 2020 වර්ෂය වන විටත් සිදු කර නොතිබුණි. | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 ඡේදය ප්‍රකාරව අපහරණ කටයුතු සිදු කළ යුතුවේ. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.8** **අනාර්ථික ගනුදෙනු**

---------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී නිවැරදි ලංසු ලේඛන පිළියෙල කිරීමකින් තොරව ප්‍රසම්පාදන දැන්වීම් පළ කිරීම හේතුවෙන් අවලංගු කර තිබූ මිල ගණන් කැඳවීම සඳහා රු.94,185ක් වැය කර තිබුණි. | ලංසු ලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

**3.9** **කළමනාකරණ දුර්වලතා**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | සමාලෝචිත වර්ෂයේදී කල්බදු කාලය අවසන් වූ වාහන 09 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල්බදු කාලය අවසන් වූ වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ආ) | මඩකලපු දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස වටා අත්තිවාරම් දැමීමකින් තොරව ඉඩමට පස් පිරවීම හේතුවෙන් වර්ෂාවට පුරවන ලද පස් සේදී ගොස් තිබුණි. | පුරවන ලද පස් සේදී යෑම වලකින ලෙස භූමිය සකසා පස් පිරවීම සිදු කළ යුතුවේ. | ප්‍රතිපාදන නොමැති වීමෙන් අත්තිවාරම් දැමීම ප්‍රමාද වූ අතර මේ වන විට මෙම කාර්යය ඉටු කිරීම සඳහා පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ජනාධිපතිවරණයට අදාල කොළඹ දිස්ත්‍රික්/නාගරික මැතිවරණ කාර්යාලයට අදාල සුහසාධක කමිටු වාර්තාව තුල මාධ්‍ය හරහා වාර්තා වූ පරිදි කාර්යමණ්ඩලයට ආහාර විස වීම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ඇතුළත්ව නොතිබුණි. | කමිටු වාර්තාවල සියළු සිදුවීම් වාර්තා කළ යුතු වේ. | සුහ සාධන කමිටුව භාර ප්‍රධාන තේරීම් භාර නිලධාරීගෙන් සංශෝධිත වාර්තාවක් ලබා ගැනීමට පියවර ගෙන ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව සේවක පුහුණු සැලැස්මක් සකස් කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව සේවක පුහුණු සැලැස්මක් සකස් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |